# ශ්‍රී ලංකාවේ දකුණු වෙරළේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ගැටවර සමලිංගික චර්යාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යනයක්

කේ.පී.එස්. හේමමාලි*

ශ්‍රී ලංකාවේ මෑත කාලීන විදේශ විනිමය උපයන මූලාශ්‍ර අතර සංචාරක කර්මාන්තය ප්‍රධාන තැනක් ගනී. 1977 දී එය කර්මාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත විය. එතැන් පටන් බාධා අභියෝග පසුබෑම් මෙන්ම වෘද්ධීන්ට ද මුහුණ දෙමින් සංචාරක කර්මාන්තය දශක කිහිපයක් පුරා ශ්‍රී ලංකා ආර්ථිකය ශක්තිමත් කරයි. මෙම කර්මාන්තය හේතු කොට ගෙන වාසි මෙන්ම අවාසිදායක ප්‍රතිඵලයන් භුක්ති විඳින රටකි ශ්‍රී ලංකාව. අප රට සුන්දර වෙරළ තීරයකින් වට වී තිබීමත් නොයෙකුත් පෞරාණික ස්ථානයන් පිහිටා තිබීම හා ආගන්තුක සත්කාර අතින් පොහොසත් වීමත් යන කරුණු හේතුවෙන් වර්තමානය වන විට සංචාරක කර්මාන්තය දීප ව්‍යාප්ත ව පවතී. එහෙත් මෙහි පර්යේෂණයේ සීමා දක්වනු පිණිස දක්ෂිණ වෙරළ තීරය පමණක් අධ්‍යයනයට හසු කරන ලදි. සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ළමුන් හා ගැටවරයන් සම ලිංගික චර්යාවට යොමු වීම හා එහි බලපෑම සාකච්ඡාවට භාජනය කළ යුතු සාමාජීය ගැටලුවකි. සංචාරක කර්මාන්තය පිළිබඳ දැක්මක් හා අවබෝධයක් ඇති විද්වතුන්, දකුණු ලක සංචාරක කර්මාන්තය වඩාත් ප්‍රචලිතව පවතින ප්‍රදේශවලින් තෝරාගත් ජන කණ්ඩායම් සමඟ සිදු කෙරුණු සම්මුඛ සාකච්ඡා හා ඔවුන් වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලි ද අදාළ දත්ත රැස් කෙරිණි. ඊට අමතරව සංචාරක කර්මාන්තය පිළිබඳ රචනා කෙරුණු පොත්පත් මෙන්ම අන්තර්ජාලගත තොරතුරු ද භාවිතයට ගැනුණි. දෙමව්පියන්ගේ අඩු අධ්‍යාපනය, සමාජ අවබෝධය හීන වීම, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව සොයා බැලීමකින් තොර වීම, ළමයින් අ.පො.ස. සා.පෙළින් අධ්‍යාපනය හමාර කිරීම, සංචාරක ඇසුරට ප්‍රවේශ වීම පහසු වීම, දෙමව්පියන්ගේ අපචාරී ක්‍රියා පිළිබඳව ගැටවරයින් දැනුවත් වී සිටීම, ආදිය මෙම ගැටලුවට හේතු වශයෙන් හඳුනා ගත හැකි විය. ඊට අමතරව සමලිංගික ඇසුරට පත් ගැටවරයින්ට තමන්ට සමීප වූ සංචාරකයෙකු සිටීම, ඔවුන්ගෙන් ප්‍රතිලාභ ලැබීම පිළිබඳ දෙමව්පියන් විරෝධයක් නොදැක්වීම හෝ ඊට ශක්තියක් නොවීමෙන් නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම, සංචාරකයන් ඇසුරු කරන සමාජයක් තුළ ජීවත් වීම සාමාන්‍යකරණයට ලක් ව තිබීමත් යන කරුණු ද සමලිංගික ඇසුරට අභිප්‍රේරණ සාධක වී ඇත. මුදල්, විදුලි උපකරණ, ජංගම දුරකථන, පා පැදි, යතුරු පැදි, ති රෝද රථ , දෙස් විදෙස් විනෝද චාරිකා, නව නිවාස ආදී ප්‍රතිලාභ රැසක් මෙතුළින් එම ගැටවරයන් භුක්ති විඳින බව පැහැදිලි විය. සමලිංගික ඇසුරට ලොල් වීම, මද්‍යසාර, දුම්වැටි, මත්ද්‍රව්‍යය ආදියට යොමු වීම, ස්වඅභිමානය බිඳ වැටීම, පරායක්ත වේෂයක් ජනිත වීම, යැපුම් මානසිකත්වයක් ඇති වීම, අසභ්‍ය සඟරා, කාම චිත්‍රපටි හා වීඩියෝ දර්ශන නැරඹීමට ඇබ්බැහි වීම මෙන්ම සමාජ රෝගයන්ට ගොදුරු වීම ආදී අහිතකර ප්‍රතිවිපාකයන්ට ගොදුරු වීම මේ අධ්‍යයනයේ දී හඳුනා ගත හැකි විය.

ප්‍රමුඛ පද - සංචාරක කර්මාන්තය, සමලිංගික, සංචාරකයින්, වෙරළාශ්‍රිත ප්‍රදේශ, ගැටවරයන්

* සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය s.h.kahandagamage@gmail.com